

# සම්පත් පැතිකඩ - 2025









## සංවර්ධන අංශය

## ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

## බළපිටිය

## පෙරවදන

ප්‍රාදේශීය සංවර්ධනය හරහා ජාතික සංවර්ධනය කරා ළඟා වීමට ප්‍රයත්නය දැරීමේ දී, ග්‍රාමීය සංවර්ධනය වඩාත් පුළුල්ව හඳුනා ගැනීම මූලික කර්තව්‍ය වේ. දිස්ත්‍රික්කය තුළ පෙරගමන්කරුවකු වශයෙන් ගමන් කිරීමටත්, සංවර්ධිත ඉලක්කයන් සපුරා ගැනීමටත්, ප්‍රාදේශීය සංවර්ධනය බෙහෙවින්ම ඉවහල් වේ.

යම් නිෂ්පාදනයක්, සේවාවක් හෝ වේවා බිහි කිරීම සඳහා ඊට අවැසි සම්පත් හඳුනා ගැනීම එහි ප්‍රථම පියවර යි. උක්ත සම්පත් කාර්යක්ෂමව හා සඵලදායිව උපයෝජනයට ගැනීමෙන්, එකී නිෂ්පාදන හෝ සේවාව වඩාත් ප්‍රශස්ත මට්ටමින් බිහි කරගත හැකි ය. එවිට එහි නිසි ඵල නෙලා ගත හැකි ය.

ප්‍රදේශය තුළ පැතිරී පවත්නා භෞතික හා මානව සම්පත් ඒකරාශී කොට අනාගත සංවර්ධිත පෙර දැක්ම දකිනු රිසියෙන් එකට එක්තැන් වූ දත්ත පද්ධතිය ''සම්පත් පැතිකඩ යි''.


මෙම කෘතිය නිර්මාණය වූයේ බළපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනාගත තිරසාර සංවර්ධනය උදෙසා නියමුවෙකු වශයෙනි. මේ තුළින් බළපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි ඉදිරි සංවර්ධනයට යම් හෝ අත්වැලක් වනු දැකීම අපගේ අරමුණ යි.

## පරිච්ඡේදය 01

## 1.1 බළපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිළිබඳ හැඳින්වීම

### 1.1.1. පිහිටීම, භූ විෂමතාවය හා ඓතිහාසික පසුබිම

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බටහිර මායිමේ වෙරළ කලාපයට සමාන්තරව කි.මී. 12ක් පමණ දික් හැඩැති තීරයක් ලෙස බළපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටා ඇත. ගාල්ල දිස්ත්‍රික්කයේ අංක 57 දරණ බළපිටිය මැතිවරණ බල ප්‍රදේශයට මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සම්පූර්ණයෙන්ම අයත් වේ. බළපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22 අතුරින් එකකි. මෙම කොට්ඨාසය ග්‍රාම නිලධාරි වසම් 52කින් සමන්විත වේ. කොට්ඨාසයේ සම්පූර්ණ භූමි ප්‍රමාණය 48.07$km^2$ක් පමණ වන අතර, කොට්ඨාසයේ පිහිටීම සිතියම් අංක 1.1 මගින් දැක්වේ.




සිතියම 1.1

බළපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වනුයේ,

| | |
|---|---|
| නැගෙනහිර දේශාංශ | - 80.1 හා 80.5 අතර ද, |
| උතුරු අක්ෂාංශ | - 6.4 හා 6.22 අතර විහිදී ඇත. |
| උතුරට | - බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| දකුණට | - අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| නැගෙනහිරට | - කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| බටහිරට | - ඉන්දියන් සාගරයට මායිම් වූ ප්‍රදේශය යි. |

### 1.1.2. භූ විෂමතාවය හා ජලවහනය

සාමාන්‍යයෙන් මෙම කොට්ඨාසයේ භූ විෂමතා විවිධත්වය ඉතා අඩු මට්ටමක පවතී. නිරිතදිග වෙරළබඩ පහත් බිම් කලාපයට අයත් මෙම කොට්ඨාසය අඩි 1,000ට අඩු උන්නතාංශයක් පෙන්නුම් කරයි. මෙහි ඊසාන කොටස බෙන්තොට හා කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිමට ආසන්නව අඩි 300ට අඩු කුඩා හුදකලා කඳුගැට කිහිපයක් දක්නට ලැබේ. නානතොටපළාත ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අඩි 234ක් උස කන්ද ද, පැළෑගස්පළාත හා පොල්අතුපළාත ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අඩි 249ක් උස පොල්අතුකන්ද ද වැඩිම උන්නතාංශයක් පෙන්නුම් කරයි. මේ හැරුනුවිට අඩි 200ක පමණ උන්නතාංශයක් පෙන්නුම් කරන ස්ථාන ලෙස නානතොටපළාත, වතුරවෙල, පැළෑගස්පළාත, බොරළුකැටිය හා පතිරාජපෙදෙස ග්‍රාම නිලධාරි වසම්වල දක්නට ලැබේ.


මේ හැරුනුවිට වඳුදූව හා හීනටිය උතුර කොට්ඨාසයන්හී උස් කඳු ගැට කිහිපයක් දක්නට ඇත. ඉහත සඳහන් ග්‍රාම නිලධාරි කොට්ඨාස හැරුනුවිට අනෙකුත් ප්‍රදේශ වෙරළබඩ පහත් තැනිතලා ප්‍රදේශයක් ලෙස හැඳින්විය හැක.

මෙම ප්‍රදේශයේ ජලවහන රටාවෙහි කැපී පෙනෙන ලක්ෂණය නම් ප්‍රදේශය හරහා ගලා බසින කුඩා ගංගාවන් තුනයි. ඒවා නම් මාදු ගඟ, රන්දොඹේ ගඟ හා දූවේමෝදර ගඟයි. මාදු ගඟ හා රන්දොඹේ ගඟ බලපිටියේ දී ඒකාබද්ධ වී බළපිටිය මෝදරින් මුහුදට එක්වන අතර, දූවේමෝදර ගඟ දූවේමෝදරින් සාගරයට එක් වේ. මෙම ජලාශ වලට ඇති භූමි ප්‍රමාණය අක්කර 2,128 කි. සියලුම ගංභාවන් ගලා බසින ගංගාවන් ලෙස නොව විශාල ජලාශ හෝ කලපු ලෙස දක්නට ලැබේ. මෙම ජලාශවල විශේෂත්වය වන්නේ ඒවා දූපත් රාශියකින් යුක්ත වීමයි. මාදු ගඟ දූපත් 64කින් සමන්විත වන බව ජනප්‍රවාදයේ ඇතත් අද අපට හඳුනාගත හැක්කේ ප්‍රධාන දූපත් 15ක් මාදු ගඟෙහි ඇති බව ය. මේ අතරින් මාදූව, මහලදූව, ගල්මන්දූව හා අප්පලදූව ජනාවාස වේ. අනිකුත් දූපත් හිමිකරුවන් විසින් කුරුඳු වගාව සඳහා මෙම දූපත් යොදා ගෙන ඇත. මුහුදු සීමාවේ සිට රට අභ්‍යන්තරයට කි.මී. 01ක්

පමණ වනතෙක් ඇත්තේ හිරිගල් මිශ්‍ර භූගත ජලය යි. මේවා ලවණ ගතියෙන් යුක්ත ය. පානය සඳහා යෝග්‍ය නොවේ. රට අභ්‍යන්තරයට යන විට ලවණ ගතිය අවම වේ.

බළපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය නිරිතදිග වෙරළබඩ පහත් තැනිතලා ප්‍රදේශයක් වන අතර වැඩි බිම් ප්‍රමාණයක් 8%කට අඩු බෑවුම් කලාපයකට අයත් වේ. බොරළුකැටිය, පොල්අතුපළාත හා පතිරාජපෙදෙස යන ග්‍රාම නිලධාරි වසම්හි සීමිත භූමි ප්‍රමාණයක් 8% - 16% බෑවුම් කලාපයට අයත් වේ.

බළපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාංශු ව්‍යූහය විවිධත්වයක් දරයි. මුහුදු බඩ බිම් තීරය වැලි සහිත රොගසෝල්ස් පසින් යුක්ත වන අතර, ලවණ ගතියෙන් වැඩි ය. භූගත ජලයේ කඨින ගතිය ද වැඩි ය. ප්‍රදේශයේ අභ්‍යන්තර කොටසට වන්නට ලැටරයිට් සහිත රතු පස පොඩ්සොලික පස ද දැකිය හැක.




සිතියම 1.2

### 1.1.3. වර්ෂාපතනය

ශ්‍රී ලංකාවේ නිරිතදිග තෙත් කලාපයට අයත් බළපිටිය කොට්ඨාසයට වර්ෂාපතනය ලැබෙන ප්‍රධාන ක්‍රියාවලීන් වශයෙන් සංවහන ක්‍රියාවලිය හා මෝසම් ක්‍රියාවලිය වැදගත් ය. මෙම ප්‍රදේශයේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.ලී. 2,173.78ක් වන අතර වර්ෂාපතනය සම ව්‍යාප්තියක් දක්නට ලැබේ. එහෙත් සමහර මාසවල වියළි තත්ත්වයක් දක්නට ලැබෙන අතර මාර්තු, අප්‍රේල් මාසවල සංවහන ක්‍රියාවලිනුත් මැයි සිට සැප්තැම්බර් දක්වා නිරිත දිග මෝසම් මගිනුත් සැලකිය යුතු වර්ෂාපතනයක් ලැබේ. මෝසම් ක්‍රියාවලිය සමග සංවහන ක්‍රියාවලිය බලවත් වීමෙන් ඉහළ වර්ෂාපතනයක් වාර්තා වී ඇත. ඔක්තෝම්බර් හා නොවැම්බර් මාසවල නැවතත් වාසුලි හා සංවහන ක්‍රියාවලිය බලපැවැත් වී වර්ෂාපතනය ලැබේ. දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා ඊසාන දිග මෝසම් බල පැවැත්වෙන කාලයේදී වර්ෂාපතනය අඩු වේ.

### 1.1.4. පරිපාලන ව්‍යුහය

බළපිටිය සම්බන්ධ පරිපාලන විකාශනය විමසීමේ දී 1947 මැතිවරණයේදී ගාල්ල දිසාවට ම තිබී ඇත්තේ මැතිවරණ කොට්ඨාස තුනක් පමණි. ඉන් එක් මැතිවරණ කොට්ඨාසයක් බළපිටිය වන අතර අනෙක් මැතිවරණ කොට්ඨාස දෙක උඩුගම හා ගාල්ල මැතිවරණ කොට්ඨාසයි. එදා බළපිටිය මැතිවරණ කොට්ඨාසයට බළපිටිය සිට ගිංතොට පාලම දක්වා ප්‍රදේශය ම ඇතුළත් වී ඇති අතර පසුකාලයේ බළපිටිය මැතිවරණ කොට්ඨාසය බළපිටිය, අම්බලන්ගොඩ, රජ්ගම, කරන්දෙණිය හා බෙන්තර - ඇල්පිටිය වශයෙන් මැතිවරණ කොට්ඨාස පහකට බෙදී වෙන් වී ඇත.

මුල්කාලයේ ප්‍රාදේශීය පාලනයේ දී මාදු ගඟෙන් දකුණු කොටස අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයටත් මාදු ගඟෙන් උතුරු කොටස බෙන්තර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයටත් අයත් ව තිබී ඇත. බළපිටිය, අම්බලන්ගොඩින් හා බෙන්තොටින් ඉවත් ව "බළපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය" ලෙස වෙන ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස ස්ථාපිත කරන ලද්දේ 1972 වර්ෂයේදී එවකට බළපිටිය පාර්ලිමේන්තු මන්ත්‍රී ව සිටි පෙට්ටගම් ඩෙඩ්‍රික් වීරසිංහ ද සිල්වා මහතා විසිනි.

බළපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආරම්භයේ දී ග්‍රාම නිලධාරී කොට්ඨාස විස්සකින් සමන්විත විය. 1977 දී පත් වූ එක්සත් ජාතික පක්ෂ රජය විසින් ග්‍රාම සේවක නිලධාරීන්ට අමතරව ග්රාම නිලධාරී කොට්ඨාස දෙකකට එක් අයෙකු වන සේ විශේෂ සේවා නිලධාරීන් දස දෙනෙකු පත් කර තිබිණි. විශේෂ සේවා නිලධාරී සේවය ග්‍රාම සේවක සේවය සමඟ ඒකාබද්ධ කිරීමත් සමඟ එම නිලධාරීන්ට ද කොට්ඨාස වෙන් කර දීමට සිදු වීම නිසා විස්සක් වූ ග්‍රාම නිලධාරී කොට්ඨාස සංඛ්‍යාව තිහ දක්වා වැඩි විය. මෙම කාලයේ ග්‍රාම සේවක සේවය, විශේෂ සේවා නිලධාරී සේවයට අමතරව කෘෂිකර්ම කටයුතු සඳහා කෘෂිකර්ම ව්‍යාප්ති සේවා නිලධාරීන් දෙදෙනෙකු හා පෙර පැවති ග්‍රාම නිලධාරී කොට්ඨාස විස්සට එක්සත් ජාතික පක්ෂ රජය මගින් ම වගා නිලධාරීන් විස්සක් ද පත් කර තිබිණි. පසුව එක්සත් ජාතික පක්ෂ රජයේ අග්‍රාමාත්‍ය ව සිටි ආර්. ප්‍රේමදාස මහතා විසින් කෘෂි ව්‍යාප්ති

සේවය හා වගා නිලධාරී සේවය ද ග්‍රාම නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීමත් සමඟ එම නිලධාරීන්ට ද සේවා කටයුතු සඳහා කොට්ඨාස වෙන් කර දීමට බළපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පැවති තිහක් වූ ග්‍රාම නිලධාරී කොට්ඨාස සංඛ්‍යාව පනස් දෙක දක්වා ඉහළ නැංවීමට සිදු විය.

බළපිටිය ප්රාදේශීය ලේකම් කොට්ඨාසය ලංකාවේ අනෙක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට විශේෂ වන්නේ භූමි සිතියමක් නොමැති එක ම ග්‍රාම නිලධාරී කොට්ඨාසය පිහිටා තිබීම හේතුවෙනි. එම ග්‍රාම නිලධාරී කොට්ඨාසය "වැලිතර" ග්‍රාම නිලධාරී කොට්ඨාසය වන අතර මේ සඳහා අයත් වන්නේ බළපිටිය, බ්‍රාහ්මණවත්ත උතුර, බ්‍රාහ්මණවත්ත දකුණ, ගල්මංගොඩ හා ඇළතොට යන ග්‍රාම නිලධාරී කොට්ඨාසයන්හී පදිංචි මුස්ලිම් ජනතාවයි.

### 1.1.5. උෂ්ණත්වය

ප්‍රදේශයේ උෂ්ණත්වය 30.34 $^{\circ}$C ක උපරිම අගයක් ගෙන ඇත්තේ අප්‍රේල් සිට ජුනි දක්වා මාසවල ය. ඊට බලපෑ ප්‍රධාන හේතුව ලෙස අප්‍රේල් මාසය තුළ හිරු මුදුන් වීම දක්නට ලැබේ. ජුනි සිට සැප්තැම්බර් දක්වා කාලවල දී ක්‍රමයෙන් උෂ්ණත්වය අඩු වී ඇත්තේ නිරිතදිග මෝසම් සක්‍රීය වීමෙන් සාපේක්ෂ ආර්ද්‍රතාවය වැඩිවීම නිසා ය. නොවැම්බර් සිට ජනවාරි දක්වා කාලය තුළ උෂ්ණත්වයේ පැහැදිලි අඩුවීමක් එනම් 23.89 $^{\circ}$C දක්වා අඩු වී ඇත්තේ ඍතුවියේ ගමන් අනුව හිරු මකර නිවර්තනයට මුදුන් වීමයි. උෂ්ණත්වය අඩු වීමට පවතින මෝසම් සුලං හා සංවහන වර්ෂාවට සාගරික බලපෑම් ද හේතුවන බව දැක්විය හැකි ය.

### 1.1.6. පාෂාණ ව්‍යාප්තිය

ඓතිහාසික පසුබිම අනුව මෙම ප්‍රදේශය තුළ ප්‍රාග් කේම්බ්‍රිය යුගයට අයත් පාෂාණ ව්‍යාප්තියක් ඇති අතර, එම පාෂාණ වර්ග අතර වානේ කයිට්ස්, බයෝමයිට් නයිස්, මෙටා අවසාදිත, මාබල් ඩොලමයිට් සහ ග්‍රැනයිට් සුවිශේෂී වේ.

## 1.2. ඓතිහාසික පසුබිම

බළපිටියට දීර්ඝ ලිඛිත ඉතිහාසයක් ඇත. එම ඉතිහාසය තුළ බළපිටිය පුරවරය ඇඹලව රහත් ගල්වෙහෙර, වාලුකා තිත්ථ, කීරවැල්ල, මහපැලැන, උතුම්ගම, සල්ගමුව, වැලිතොට ආදී ලෙස හඳුන්වා ඇත. මින් වඩාත් ප්‍රචලිතව ඇත්තේ වැලිතොට නාමයයි. මෙලෙස බළපිටිය එකල වැලිතොට නමින් හඳුන්වන්නට බලපෑ බවට සැක කෙරෙන හේතු කිහිපයකි. ඉන් එක් අදහසක් නම් වැලි ගඟ (වර්තමානයේ මාදු ගඟ) ඇසුරින් වැලිතොට නිපන් බවයි. මෙම වැලි ගඟේ තොට වැලිතොට වූ බව ඉන් අදහස් කෙරේ. තවත් මතයක දැක්වෙන්නේ දඹදිවෙන් ලක්දිවට පැමිණි බමුණන් විසින් "වාලුකා දේශය" (ශ්‍රී සුමංගල ශබ්දකෝෂය ii වෙළුම, 1033 පිටුව) යනුවෙන් දක්වා ඇත්තේ ද දම්පියා අටුවා ගැටපදයෙහි "වාලුකාය - සාලියා රටහි" යනුවෙන් හඳුන්වා ඇත්තේ ද වැලිතොට බවයි. වාලුකා යන්නෙහි අරුත වැලි යන්නයි. තවත් අදහසක දැක්වෙන්නේ පතිරාජ පරිවේණාධිපති හිමියන් විසින්

රචනා කළ සිදත් සඟරා ව්‍යාකරණ ග්‍රන්ථයෙන් “උභයභාෂාලංකාරයට” නිදසුන් දැක්වූ තැන වැලි නදිය නමින් හඳුන්වන්නේ වර්තමාන මාදූ ගංගාව බවයි. එහි දේවපතිරාජ ඇමති කේරළයන් නැසූ ලෙයින් වැලි නදිය වර්ණවත් වූ බව සඳහන් වේ. කේරළ බලය මැඩීමේ සටන සිදුව ඇත්තේ වැලි නදිය පෙදෙසෙහිදී ය. සතුරු සෙනඟ පළවා හැර දේව පතිරාජ අමාත්‍යවරයාගේ බළ පිරිස ලැගුම්ගත් බිම් පෙදෙස වැලි ගඟේ දකුණු ඉවුරේ පිහිටි අතර එහි කඳවුරක් ද විය. මුවදොරට දකුණින් පිහිටි කඳු ගැටය සහිත බිම් තීරය කඳවුර තිබූ තැන ලෙස සිතිය හැකි අතර එම බල පිරිස කඳවුරු බැඳි බිම බල - සෙන් පිරි අරුතින් බට - සිටිය බට - පිටිය ආදී වශයෙන් හඳුන්වා පසුකාලයේ බළපිටිය යනුවෙන් හඳුන්වා ඇත.

බලවුන් දන රැඳි කඳවුරු කුල පවර
බලරුපු සෙන් මෙන් සැරසුනු යුධ ඇසුර
බලසෙන් අවිගෙන රැක සිටි බැවින් පෙර
බලපිටි නම් විය මෙගමට දන් මිතුර (කොකැටු සන්දේශය, 1905: 59 පද්‍ය)

බළපිටිය පුරවරයේ ඉතිහාසය මතු කර ගැනීමට වැඩි වශයෙන් ඉවහල් වන වංශ කතා අතර මහාවංශය, ධාතුවංශය, සිංහල බෝධි වංශය ප්‍රධාන තැනක් ගනී. එමෙන්ම සංදේශ කාව්‍ය බොහෝ ප්‍රමාණයක ද මෙම වැලිතොට පිළිබඳ ව සඳහන්වී ඇත. මයුර, තිසර, පරෙවි, කොවුල් සහ ගිරා යන සංදේශ කාව්‍ය ඒ අතර වේ. හංස සංදේශයේ ද වැලිතොට අම්බලම පිළිබඳ විශේෂයෙන් සඳහන් වේ.

## මයුර සංදේශය

මුල්වරට වැලිතොට පිළිබඳව සඳහන් වන්නේ මයුර සංදේශය තුළයි. මයුරා ගඟසිරිපුර සිට දෙවිනුවරට යන ගමනේදී බෙන්තොටින් මහ තොරතුරු දැක නික්මී එන මග වැලිතොට දුටු බව සඳහන් කරයි. එහිදී විශේෂයෙන් කොස්ගොඩ පරතරකයේ සෙබළ කඳවුර දුටු බව සඳහන් කර ඇත.

දෙනෙතට වතට වලඟට පිය පියොවුර ට
සරිකොට ළවම් මෙලොවැ මැ නොසිතෙන සිතට
තොපදුට වෙතට එන අඟනන් සතුටු කොට
**වැලිතොට** ගමට වැදැ රහකොටැ යන් එපිට (මයුර 79 කවිය)

## තිසර සංදේශය

මහදම්පා මුවදොරින් පසු තිසරාට වැලිතොට හමු වේ.

මුතුපට සේය වැලිතල උදුල මුවදොර
දියපිට යේය දිසිවරු තගෙ මැ මනහර
සහතුට ඒ ය සිය ලිය යන සැකිනෙවර
**වැලිතොට** ඒ ය ඉන්ලැසි නොවැ යවමිතුර (තිසර 67 කවිය)

**<u>පරෙවි සංදේශය</u>**

ජයවර්ධනපුර සිට දෙව්නුවරට යන පරෙවියා හට වැලිතොට හමුවූ බව පරෙවි සංදේශයෙහි මෙලෙස සඳහන් වේ.

අයුරු තිසර තන බැඳැ රන් පටින් පිටින්
මියුරු තෙපුල් තෙපලන ලිය කටින් කටින්
සොඳුරු සෙලළු මුළු දැකැ එන වටින් පිටින්
මිතුරු වඩින් මනහර **වැලිතොටින්** තුටින් (පරෙවි 77 කවිය)

**<u>කොවුල් සංදේශය</u>**

දෙව්නුවරින් පිටත් වූ කොවුලා යාපා පටුනට යන අතරතුරදී වැලිතොට වර්ණනා කර ඇත්තේ මෙසේ ය.

තොටගමු පාය රැඳි මහතෙරිඳු ගුණ හිවී
සත සැප සේ ය යන ලෙසැ රැකැ තමන් දිවී
දළ සල මේය තර කර කැරැවූ බැහැවී
**වැලිතොට** ඒ ය සිරි දැක වඩනේ මැනවී (කොවුල් 85 කවිය)

**<u>ගිරා සංදේශය</u>**

ජයවර්ධනපුරයේ සිට නික්මෙන ගිරවා වැලිතොටට පැමිණ රැයක් එහි ලැගුම් ගෙන පසුදා උදයෙහි මහදම්පා මුවදොර, කසාව (කහව) පසු කොට තොටගමු වෙහෙර වැඳ ගමන අවසන් කරයි.

එළිකොට අවට රිවි බට සිඳු මැඳුරතට
එකවිට ලොවට එළි බට ගන'දුර කඳට
රොසකොට යුදට අඹරට සඳ එන කලට
**වැලිතොට** ගමට ලැගුමට ගොස් මහ නොසිට (ගිරා 109 කවිය)

වැලිතුඩුව, අසුන්ගල් කඩුව, වැලිතොට, කොස්ගොඩ, වැලිතොට අම්බලම ආදී වැලිතොටට අයත් විවිධ ස්ථාන පිළිබඳව සංදේශ කාව්‍ය තුළ මහ වැනුමේ වර්ණනා සිදු කර ඇති අයුරු සංදේශ කාව්‍ය විමසීමේදී පැහැදිලි වේ.

බළපිටිය හෙවත් පුරාණ වැලිතොට නම් වූ මෙම ඓතිහාසික පුරවරය හැඳින්වීම සඳහා යොදා ගන්නා ලද අන්වර්ථ නාම බොහෝ ය. විරුවන්ගේ පුරවරය, වියතුන්ගේ පුරවරය, දානපතීන්ගේ පුරවරය, බෝසත්වරුන්ගේ පුරවරය, බ්‍රාහ්මණයින්ගේ පුරවරය වශයෙන් ද මෙම පුරවරය හඳුන්වා ඇත.

බළපිටිය හඳුන්වන එක් අනුවර්ථ නාමයක් වන්නේ "වීරයන්ගේ පුරවරය" යන්නයි. දඹදෙණි රාජ සමයේ (ක්‍රි.ව.1258)දී චන්ද්‍රභානු සෙන්පතියා ප්‍රමුඛ කේරළ ආක්‍රමණිකයන් වැලිතොටදී සමූල ඝාතනය කරමින් වාලුකා නදිය (මාදූ ගඟ) ලෙසින් සිතුවම් කොට මච්චිම රැකගත් සිංහල හමුදාවට නායකත්වය දෙනු ලැබුවේ දේවපතිරාජ අමාත්‍යවරයා ප්‍රමුඛ වැලිතොටින් ගිය සේනාවයි. එමෙන්ම මහනුවර රාජධානි සමයේ සෙනරත් රජු කල (වර්ෂ 1630 සැප්තැම්බර් විසි වෙනි දින) රන්දෙණිවෙල සටනේදී කොන්ස්තන්තීනුදසාගේ පරංගි හමුදාව සමූල ඝාතනය කළ සිංහල සේනාධි නායකයා වූයේ අභීත බලපිටි පුත්‍ර දොන් කොස්මෝ විජේසේකරයන් ය. ලංදේසි පාලන සමයේ (ක්‍රි.ව.1762)දී ඉන්දියාවේ කොචින් දේශයේ පැවති විශාල කැරැල්ල මර්දනය කළේ ද නන්එදිරි ඩුමිංගු මැගිලියන් වීරතුංග සේනානායක හා බැන්ටියුසල් මැගිලියන් වීරතුංග සේනානායක යන බලපිටි පුත්‍රයන් ය. එසේම මිෂනාරීන් සමඟ පංච මහාවාදයේ යෙදෙමින් ඔවුන්ව අන්ත පරාජයකට පත් කරමින් මිගෙට්ටුවත්තේ ශ්‍රී ගුණානන්ද හිමියන් සමත් වන්නේ බලපිටි පුරවරයේ වීරවරුන්ගේ නාමාවලිය තවත් ආලෝකමත් කරමිනි.

බළපිටිය විරුවන්ගේ මෙන් ම වියතුන්ගේ ද පුරවරයයි.

- මිගෙට්ටුවත්තේ ශ්‍රී ගුණානන්ද නාහිමි
- වැලිතර ඒ.යූ.ඒ.ඤාණතිලක හිමි
- ජයන්ත වීරසේකර
- ඒ.පී.ද සොයිසා
- ලුවී ද සොයිසා විජේසේකර ජයතිලක මහමුදලි
- මැන්දිස් ගුණසේකර විජය ශ්‍රී වර්ධන (සිංහල ඉංග්‍රීසි ශබ්ද කෝෂයේ නිර්මාතෘ)
- වලිමුණි අරුණෝලිස් මැන්දිස් අබේසේකර (පංචාංග ලිතේ නිර්මාතෘ)
- සී.ඩබ්.ඩබ්.කන්නන්ගර (ලංකාවේ නිදහස් අධ්‍යාපනයේ පියා)
- ඒ.එන්.එස්.කුලසිංහ (පෙර සවි කොන්ක්‍රීට් ක්‍රමය හඳුන්වා දුන්)
- නීතිඥ හෙන්රි ජෝන් මැන්දිස් වික්‍රමරත්න සේනානායක
- ප්‍රතිභාපූර්ණ කිව්වර විමල් අබේසුන්දර ආදී වියතුන් බළපිටිය පුරවරයෙන් ජන්මලාභය ලබා තිබේ.

මාදූ ගඟේ කොත්දූව බෝ රුකට අරක් ගත් දෙවිඳුගෙන් රාජපක්ෂ මන්ත්‍රී පරපුරට ආශිර්වාද පතා රන්දොඹේ සිට එකී බෝධිය වෙත දූත ගමනේ යෙදුනු "කොකැටු සංදේශය" (1905), අලු කොබෝ සංදේශය, බට කුරුලු සංදේශය (1917), කැණරි සංදේශය වැනි සංදේශ ගණනාවක් මෙන් ම වියරණ මල්දම, සැළලිහිණි සංදේශ විවරණය, ශිලා ලිපි සංදේශ සහ හෝඩිය වැනි ග්‍රන්ථ ගණනාවක් රචනා කළ නීතිඥ හෙන්රි ජෝන් මැතිතුමා බලපිටියෙන් බිහිවූ වියතෙකි. එමෙන්ම ලංකාවේ ප්‍රථම වරට පළ කරන ලද සිංහල ඉංග්‍රීසි ශබ්ද කෝෂය සහ ඉංග්‍රීසි සිංහල ශබ්ද කෝෂයේ මෙන් ම ලංකාවේ ප්‍රථම වතාවට සිංහල භාෂාව (1891) නමින් සිංහල ව්‍යාකරණ අඩංගු ඉංග්‍රීසි, සිංහල දෙබසින් ම ලියා පළ

කරන ලද ග්‍රන්ථයේ නිර්මාතෘවරයා ද වන්නේ බළපිටිය වාසල වලව්වේ තිරිමාදූර ඒබ්‍රහම් මැන්දිස් ගුණසේකර විජය ශ්‍රී වර්ධන වාසල මුදලිතුමා ය. මෙතුමා "ෆ" අක්ෂරයේ නිර්මාතෘවරයා ද වේ. එසේ ම සතළොස් වියේදී රජයේ ලිපිකරු විභාගයෙන් සමත් ප්‍රථම ලාබාලතම ලාංකිකයා බවට ත්‍යාග දිනා ගත්තේ ද මෙතුමායි. අසම්පූර්ණ ජාතක කතා පොත ජාතක කතා පන්සිය පනහ ම ඇතුළත් කොට අංග සම්පූර්ණ කළ පැරණිතම සන්දේශ කාව්‍ය මියුරු සන්දේශ බව සාධක සහිත ව ඉදිරිපත් කළ ප්‍රථම විද්වතා 'පද සාධන ටීකාව' (1873) සහ 'මොග්ගල්ලාන වුත්ති සන්නය' යන පාලි පුස්කොළ පොත් මුල්වරට සොයා ගෙන ලංකාවේ ප්‍රථම පුස්කොළ පොත් නාමාවලිය සැකසූ පඬිවරයා වූ රාජකීය ආසියාතික සමිතියේ සාමාජිකත්වය දිනා ගත් ප්‍රථම ලාංකිකයා වූයේ ද වැලිතොට හාරඹ වලව්වේ උපත ලත් ලුවී ද සොයිසා විජේසේකර ජයතිලක මහ මුදලිතුමාණන් ය. වර්ෂ 1940 දී ධර්ම සමය නමින් මුද්‍රණාලයක් පිහිටුවා ධර්ම සමය පුවත්පත නිකුත් කළ සහ මෑතකදී ලෝක උරුමයට එක් කළ පාලි ත්‍රිපිටකය සරල සිංහල භාෂාවට පරිවර්තනය කළ ප්‍රථම ලාංකිකයා බවට පත් වූයේ ඒ.පී. ද සොයිසා මැතිතුමායි. මෙතුමා රචිත ග්‍රන්ථ ද විශාල ප්‍රමාණයක් වේ.

තවදුරටත් ඩී.ඒ.රාජපක්ෂ, කොස්ගොඩ ඇන්.බී.ඇස්.විජයරත්න, ඩබ්.ඩී.ඒ.රාජපක්ෂ, අහුන්ගල්ලේ ජෝන් සිරිමන් ද සොයිසා (සිංහල ශබ්ද කෝෂයේ සම්මාන කර්තෘ පදවිය හෙබවූ), අහුන්ගල්ලේ එන්.කැතරින් ද සිල්වා, වෛද්‍ය ඒ.රිචඩ් ද සොයිසා, ඕ.ඇම්.ඔබේසේකර, ඩී.ඩී.ඇම්.සෙනෙවිරත්න, නීතිඥ එච්.සී.නිශ්ශංක, වර්ණකුල මර්තේනිස් මැන්දිස්, ලක්ෂ්මන් දේවසේන, ඩබ්.ඒ.බර්ටි කුලතුංග, කලාභූෂණ සම්මාන ලාභී මාදුවේ රන්දොඹගේ ජීඩින් ද සිල්වා, කලාකීර්ති පණ්ඩිත් විමල් අභයසුන්දර, පී.ආර්.ද සිල්වා, වෛද්‍ය ර්.ඇම්.විජේරාම වැනි වියතුන් බොහෝ ප්‍රමාණයක් බළපිටිය පුරවරයෙන් බිහිව සිංහල සාහිත්‍යයේ උන්නතියට අපරිමිත සේවයක් සිදු කර ඇත.

බළපිටිය නාමය දීප්තිමත් කළ වියතුන් මෙන් ම ශ්‍රී ලාංකික නාමය ජාත්‍යන්තරයට ගෙන ගිය පුද්ගලයන් ද බළපිටිය පුරවරයෙන් බිහිවී තිබේ. බලි තොවිල් ජාත්‍යන්තරයට ගෙන ගිය අහුන්ගල්ල, ලෝකන්වත්ත ප්‍රදේශයේ උපත ලද කේ.ඇස්. ප්‍රනාන්දු මහතා චිත්‍ර, කැටයම් කැපීම, ගොක්කොළ නිර්මාණ, ශාන්තිකර්ම, වාදනය, ගායනය මෙන් ම පහතරට නැටුම් ශිල්පයෙහි ද ප්‍රවීනයෙකි. ගමේ තොවිල්වලට පමණක් සීමා වී තිබූ නර්තන විෂය බලි තොවිල්, ශාන්තිකර්ම ආදිය විශ්වවිද්‍යාලයට, රෝමය, ප්‍රංශය, ඕලන්දය, එංගලන්තය, කැනඩාව, ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය යන බටහිර රටවල වේදිකාවට ගෙන යාමේ ගෞරවය එතුමාට හිමි වේ. ජාත්‍යන්තර ගුරු දිනය නිර්මාණය කොට ගුරු සේවයේ වටිනාකම ජාත්‍යන්තර තලය දක්වා ගෙන ගොස් සෑම වසරක ම ඔක්තොම්බර් මස හය වැනි දින ඒ සඳහා නම් කොට එදිනට ලොව පුරා විසිරී සිටින සමස්ත ගුරු සේවය ම ඇගයීම සඳහා ජාත්‍යන්තරය අවදි කිරීමේ ගෞරවය හිමි වන්නේ බළපිටිය කොස්ගොඩ උපත ලද ඇම්.ජී.මැන්දිස් මැතිතුමාටයි. 1975 වසරේ ලෝක කුසලාන ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරමින් වේග පන්දුවෙන් ශ්‍රී ලංකාවට ජයග්‍රහණ ලබා දුන් ඩී.එල්.එස්.ද සිල්වා මැතිතුමා ද ලාංකික නාමය ජාත්‍යන්තරය වෙත ගෙන යාමට උරදුන් බලපිටි පුත්‍රයෙකි.

තවදුරටත් සවිය සංවර්ධන පදනමේ නිර්මාතෘවරයා වන ආචාර්ය වින්ස්ටන් ද සිල්වා මැතිතුමා, ලංකා කම්කරු පක්ෂයේ නායක ර.සෝ.කදිරගොන්න මැතිතුමා, නාඩගම් කලාවේ නව පුනරුදයක් ඇති කළ චාර්ලිස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ, රූකඩ කලාවෙන් රන් සම්මාන දිනූ ගම්වාරි පොඩිසිරිනා ගුරුන්නාන්සේ, ශ්‍රී ලංකාවේ ප්‍රථම කාන්තා දිසා පදවිය ඉසිලූ ස්වර්ණපාලි විජයසේකර මැතිනිය, සාම්ප්‍රදායික විහාර සිතුවම් කලාව නව මගකට ගෙන ගිය චිත්‍ර ශිල්පී සාර්ලිස් මාස්ටර් වැනි සුවිශේෂ පුද්ගලයන් රැසක් බළපිටිය පුරවරයෙන් බිහි ව තිබේ.

එසේ ම බළපිටිය ලාංකේය දේශපාලන සුවිශේෂ නායකයන් රැසක් බිහි කළ අභිමානවත් පුරවරයකි. ශ්‍රී ලංකාවේ දේශපාලන නායකයන්ගේ නාමාවලියේ,

- රණසිංහ ප්‍රේමදාස (හිටපු ජනාධිපති)
- ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
- ඊ.ඇම්. විජයාරාම
- සී.ඩබ්.ඩබ්.කන්නන්ගර
- සී.පී.ද සිල්වා
- ශ්‍රීමත් ලලිත රාජපක්ෂ (ශ්‍රී ලංකාවේ ප්‍රථම අධිකරණ අමාත්‍යවරයා)
- ස්ටැන්ලි සොයිසා
- නිතීඥ එච්.ශ්‍රී.නිශ්ශංක
- ෆ්‍රැන්සිස් ද සොයිසා
- රොබට් සොයිසා
- සිරිල් සොයිසා
- නෝර්මන් වෛද්‍යරත්න
- අසෝක වීරසිංහ ආදී ලෙස බළපිටිය පුරවරයෙන් බිහිවූ දේශපාලඥයින්ගේ නම් රැසක් හමු වේ.

අතීතයේදී දානපතියන්ගේ පුරවරය නමින් ද බළපිටිය හඳුන්වා තිබේ. දානපතියන් රැසක් බිහි වීමත් ඔවුන් සිදු කළ අනුග්‍රහයනුත් ඊට හේතු වන්නට ඇත. බලපිටියෙන් උපන් දානපතීන් වශයෙන්,

- වැලිතර මහකප්පින වලව්වේ සැම්සන් රාජපක්ෂ මහමුදලි
- බළපිටිය ගරුමුණි වලව්වේ රොබට් ද සොයිසා
- ශ්‍රීමත් ලලිත රාජපක්ෂ
- ශ්‍රීමත් සිරිල් ද සොයිසා
- ඉයන් ද සොයිසා ආදීන් හැඳින්විය හැක. ඔවුන් ඉටු කළ මෙහෙවර අතර ගාලු කොටුවේ පිහිටි ඔරලෝසු කණුව ඉදි කිරීමට නගරවාසීන් තීරණය කළ විට මහජන බදු මුදල් වියදම් කිරීමට විරුද්ධව තමන්ගේ පෞද්ගලික මුදල් යොදවා ඔරලෝසු කණුව ඉදි කිරීමට අනුග්‍රහය ලබා දුන්නේ සැම්සන්

රාජපක්ෂ මහමුදලිතුමන් විසිනි. ඒ බව වර්තමානයේදී එම සිහිවටනයේ ඇති සෙල්ලිපියේ සඳහන් කර ඇත. එමෙන්ම කටුනායක ගුවන් තොටුපළ ඉදි කිරීමට ඉඩම් අක්කර දහසක් පරිත්‍යාග කිරීම, කොළඹ ආනන්ද විද්‍යාලය, අහුන්ගල්ල රාජපක්ෂ විද්‍යාලය සහ කොළඹ වෛද්‍ය විද්‍යාල ආරම්භ කිරීමට ඉඩම් පරිත්‍යාග කර ඇත්තේ ටියුඩර් රාජපක්ෂ මුදලිතුමන් විසිනි. රේවත විද්‍යාලය හා ගුරු විද්‍යාලය සඳහා ක්‍රීඩා පිටිවලට අවශ්‍ය ඉඩම් ශ්‍රීමත් ලලිත රාජපක්ෂ මහතා විසින් පරිත්‍යාග කර ඇත. එමෙන්ම කළුතර බෝධි භාරකාර මණ්ඩලය පිහිටු වීම, කළුතර විද්‍යාලය ආරම්භ කිරීම, කතරගම කිරිවෙහෙර නැවත ප්‍රතිසංස්කරණය කිරීම, මාර්ග ඉදි කිරීම මෙන් ම කතරගම වන්දනාවේ යන්නන් සඳහා සුවිශාල වූ විශ්‍රාම ශාලා ඉදි කිරීම ද ෆෙඩ්රි ද සොයිසා මැතිතුමා විසින් සිදු කර ඇත.

තවදුරටත් මෙම පුරවරය බ්‍රාහ්මණයින්ගේ පුරවරය ලෙස ද හඳුන්වනු ලබයි. සොළීන් නසා ලංකාද්වීපය එක්සේසත් කළ ‘‘කීර්ති’’ නමින් හැඳින්වුන පළවන විජයබාහු රජතුමා පුලස්ති පුරවරය හෙවත් පොළොන්නරුව සිය රාජධානිය වශයෙන් නම් කර රාජාභිෂේකය කළ බවට මහාවංශයේ සඳහන් වේ. අභිෂේක මංගල්‍ය සඳහා උතුරු භාරතයේ උභය කුල පාරිශුද්ධ වංශවත් බ්‍රාහ්මණයින් පිරිසක් කැඳවා ගෙන ඒමේ කාර්ය පවරන ලද්දේ එකල වෙළෙඳ කටයුතු භාරව සිටි බේරුවල ගොරකාදූවේ විසූ පෙරිය මරික්කාර් නම් මුස්ලිම් ජාතිකයාට බව ‘‘හෙළදිව බමුණු වත’’ නම් ග්‍රන්ථයේ සඳහන් වේ. රුවල් නැවකින් උත්තර භාරතයට ගිය හෙතෙම ශාලි ග්‍රාමයට ගොස් ‘‘නන්බුදිරි, කප්පින, වීරසිංහ, වීරක්කොඩි, ඉදිරිමුණි, වලිමුණි හා එදිරිසිංහ යන සත් බමුණන් මෙරට කැඳවා රාජාභිෂේකය උසස් අන්දමින් සිදු කළ බවත් එම බ්‍රාහ්මණයින්ට තාන්න, මාන්න, ගම්බිම් ඇතුළු වරප්‍රසාද දී බළපිටිය ප්‍රදේශයේ පදිංචි කරවූ බව හෙළදිව බමුණු වතේ වැලිතර, කොස්ගොඩ, මාදමේපේ යන කවිය තුළ සඳහන් වේ. බළපිටිය බ්‍රාහ්මණවත්ත නමින් හඳුන්වන ප්‍රදේශය මෙලෙස බමුණන් පදිංචි වූ ප්‍රදේශය ලෙස පිළිගත හැකි සාධක ඇත. සත් බ්‍රාහ්මණයින්ගෙන් පැවත එන එම වාසගම් සහිත ජන කොටස් තවමත් බළපිටිය ප්‍රදේශයේ ජීවත් වේ. එසේම ජනප්‍රවාදවලට අනුව දළදා වහන්සේ රැගෙන ආ හේමමාලා කුමරිය සහ දන්ත කුමරු බ්‍රාහ්මණයින් බවත් ඔවුන් දළදා වහන්සේ රැගෙන අනුරාධපුරයට නොගොස් දකුණු වැලි නදියේ කොත්දූවට වැඩම කරවා පසුව කිත්සිරි මෙවන් රාජ සමයේදී දළදා වහන්සේ රැගෙන අනුරාධපුරයට ගිය බව කියැවේ. එම කාලය තුළ ඔවුන් ලැගුම් ගෙන සිටි ප්‍රදේශය බ්‍රාහ්මණවත්ත වශයෙන් ප්‍රසිද්ධ වූ බව ද සඳහන් වේ.

ශ්‍රී ලංකාවේ වලව් පුරාණය අතර බළපිටිය විශේෂ වන්නේ එක ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වැඩි ම වලව් ප්‍රමාණයක් දැකිය හැකි බැවිනි. ඒ අතර,

- මහ කප්පින වලව්ව
- ගරුමුණි වලව්ව
- මුහන්දිරම් වලව්ව
- එදිරිසිංහ වලව්ව
- රෙජිස්ට්‍රාර් වලව්ව

- ගොඩැල්ල වලව්ව
- හාරබෙ වලව්ව
- දසනායක වලව්ව
- මහගෙදර වලව්ව
- පොඩිගෙදර වලව්ව
- රාජපක්ෂ දෙවන වලව්ව
- කුරුඳුවත්ත වලව්ව
- වැල්ලඩබ මහගෙදර වලව්ව
- නොතාරිස් වලව්ව
- සේනානායක වලව්ව
- වාසල වලව්ව ආදිය වේ.

මෙරට සියම් නිකාය (පාර්ශව 6), රාමඤ්ඤ නිකාය, අමරපුර නිකාය (පාර්ශව 22) ලෙස නිකායන් තුනක් වර්තමානයේ පවතින අතර අදටත් භික්ෂු පරපුරෙන් හරි අඩකටත් වඩා ප්‍රමාණයක් අයත් වන්නේ අමරපුර නිකායටයි. අමරපුර නිකාය පිහිටුවනු ලබන්නේ එතෙක් අඩු කුලවලට අයත් භික්ෂූන් හට උපසම්පදාව ලබා ගැනීමට හැකියාවක් නොමැති ව තිබූ නිසාවෙනි. අඹගහපිටියේ ඤාණවිමල තිස්ස හිමි ප්‍රධාන පිරිසක් බුරුමයේ අමරපුරයට ගොස් උපසම්පදාව රැගෙන පැමිණ අමරපුර නිකාය පිහිටු වන ලදි. බළපිටිය පුරවරය තුළ අමරපුර නිකායට අයත් නිකාය මූලස්ථාන 5ක් ද පිහිටා ඇත. එනම්,

- සමස්ථ අමරපුර නිකායේ මූලස්ථානය - වැලිතොට අම්බරුක්ඛාරාමය
- උඩරට අමරපුර නිකායේ මූලස්ථානය - බෝගහපිටිය සිරි බෝධි විජයාරාමය
- අමරපුර සද්ධම්මවංස නිකාය මූලස්ථානය - මහකප්පින වලව්ව සීමාමාලක විහාරස්ථානය
- අමරපුර චූලසන්ථි නිකාය මූලස්ථානය - වැලිතර පුෂ්පාරාමය (නායක පන්සල)
- අමරපුර අඹගහපිටිය පාර්ශවයේ නිකාය මූලස්ථානය - රන්දොඹේ මහා චෛතිය විහාරස්ථානය ද වේ.

බළපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ විහාරස්ථාන 85ක් සහ සිල්මාතා ආරාම 03ක් ඇති අතර ඉන් 05ක් රජමහා විහාරස්ථාන ය. එනම්,

- අම්බරුක්ඛාරාමය (දෙවනි මිහින්තලාව ලෙස විරුදාවලි ලබා ඇත).
- ගනේගොඩැල්ල රාජමහා විහාරය
- කොත්දූව සිරිපවර බෝධිරාජාරාමය
- ගල්වෙහෙර මළුව රාජමහා විහාරය
- සංසරාජ රාජමහා විහාරය වේ.

බලපිටියෙන් බිහිවූ ප්‍රභූන්ට ගෞරවය පිණිස ශ්‍රී ලංකාවේ තැපැල් දෙපාර්තමේන්තුවෙන් සමරු මුද්දර නිකුත් කර ඇත. ඒ අතර,

- වැලිතොට ඥාණතිලක නාහිමි
- වැලිතොට ඥාණවිමල තිස්ස නාහිමි
- මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
- සී.පී.ද සිල්වා
- එච්.ශ්‍රී නිශ්ශංක
- ශ්‍රිමත් සිරිල් ද සොයිසා
- සී.ඩබ්.ඩබ්.කන්නන්ගර
- ඒ.පී.ද සොයිසා
- ආනන්ද රාජකාරුණා
- කොල්වින් ආර් ද සිල්වා ආදී ප්‍රභූන් වෙනුවෙන් නිකුත් කර ඇති මුද්දර දැකිය හැකි ය.


බලපිටියේ සුන්දරත්වය ශ්‍රී ලංකාවේ ටෙලි සිනමා තිර අතර දැකිය හැකි විශේෂ අංගයකි. ගම්පෙරළිය, විරාගය, මඩොල් දූව ටෙලි නාට්‍ය, ස්වයංජාත, කෝළම් කුට්ටම ආදී ටෙලි සහ සිනමා නිර්මාණ බලපිටියේ සුන්දරත්වය සුන්දරවූ මතකයක් ලෙස විරාජමාන කරවයි.

එමෙන්ම බළපිටිය තුළ දක්නට ලැබෙන තවත් විශේෂ අංගයක් වන්නේ සලාගම වංශය නියෝජනය කරන සලාගම වංශික කොඩිය ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ ප්‍රදර්ශනයට තබා ඇති කුලයක් නියොජනය කරන එකම කොඩිය ලෙසිනි. (ඡායාරූපය 1.1)

මෙලෙසින් බළපිටිය පුරවරය සම්බන්ධ ඓතිහාසික පසුබිම ඇත අතීතය දක්වා විහිද යන අතර ලාංකික නාමය බැබලවූ පුද්ගලයින් රාශියක් ද බළපිටිය පුරවරයෙන් බිහිව ඇත.



ඡායාරූපය 1.1. සලාගම වංශික කොඩිය


Balapitiya D.S. Division
Bentota D.S. Division
16A
16B
16D
15
16C
Dodwe ganga
16
17B
24D
Balapitiya D.S. Division
17A
17C
17
24B
24A
17D
24C
18
24E
Karandeniya D.S. Division
18A
24
19B
19A
Madu ganga
23
20A
19
21A
20
21
20B
90
89
21E
21C
90A
87D
89B
87B
87H
87
87C
89A
87F
87A
Randombe ganga
88B
87E
87G
88
88A
88C
Ambalangoda D.S. Division
Kilometers

සිතියම 1.3